# هل سألت نفسك؟ من خلقك؟ ولماذا؟ وماذا بعد الموت؟ (للجمعية)

# ඔබ ඔබේම හදවතින් විමසා බැලූවෙහි ද? ඔබව මැව්වේ කවු ද? ඒ ඇයි? මරණයෙන් පසු කුමක් වේවි ද?

# ඔබ ඔබේම හදවතින් විමසා බැලුවෙහි ද? ඔබව මැව්වේ කවු ද? ඒ ඇයි? මරණයෙන් පසු කුමක් වේවි ද?

විවිධ භාෂාවලින් ඉස්ලාමීය අන්තර්ගත සේවා සංගමයේ අධ්‍යාපන අංශය.

## ඔබ ඔබෙන් විමසා බැලුවෙහි ද? ඔබව මැව්වේ කවු ද? ඒ ඇයි? මරණයෙන් පසු කුමක් පවතින්නේ ද?

විවිධ භාෂා සඳහා වූ ඉස්ලාමීය අන්තර්ගත තොරතුරු පිළිබඳ සේවා සංගමයේ අධ්‍යයන කමිටුව

අහෝ මිනිස, ඔබව මැව්වේ කවු ද? ඔබේ ශරීරය අන්වීක්ෂයක් උපකාරයෙන් නිරීක්ෂණය කළහොත්, ඔබට නිශ්චිතත්වය සහ විස්මයකාරීත්වය පිරි

ලෝකයක් දැකිය හැකිය. ඔබේ ශරීරයේ සෑම සෛලයකම සංකීර්ණවූ ජානික තොරතුරු අන්තර්ගතය. මෙම කේත ලියා ඇත්තේ කවුදැයි ඔබ ඔබෙන් අසා තිබේ ද? එය නිවැරදි ස්ථානයේ තැබුවේ කවුද?

සෑම උස් ගොඩනැගිල්ලක්ම, ඉදි කරන ලද සෑම නිවසක්ම එහි නිර්මාණකරුගේ කතාව කියයි. එසේ නම්, මෙම පුළුල් විශ්වය, එහි අලංකාරය, සියුම්භාවය සහ විස්තරවල නිශ්චිතතාවය මැවුම්කරුවකුගෙන් තොරව පවතිනු ඇතැයි සිහිබුද්ධියක් ඇති කෙනෙකුට පිළිගත හැකිද?

අහෝ මිනිස, ඉතාමත් නිපුණත්වයෙන් නිර්මාණය කළ ස්මාර්ට් දුරකථනයක් නිර්මාණකරුවකු හෝ නිෂ්පාදකයෙකු හෝ නොමැතිව ක්ෂණිකව ඇති වූවක් බව හෝ සමාන්විතව සහ නිවැරදිව ක්‍රියාත්මක වන සංකීර්ණ මෘදුකාංග ජාලයක් නිර්මාණකරුවකු හෝ

පාලකයකු හෝ නොමැතිව ඇතිවූවක් බව පැවසීම ඔබේ බුද්ධිය පිළිගන්නේ නැත. එසේම, මෙම මහා විශ්වය, එහි සියලුම පද්ධති, නිර්මාණශීලීත්වය, නිවැරදි නීති සහ පරිපූර්ණ පද්ධතියක් මැවුම්කරුවෙකු නොමැතිව ඇතිවිය යැයි පැවසීම ද ඔබේ බුද්ධිය පිළිගන්නේ නැත.

මෙම විශ්වයේ සෑම කොටසක්ම, කුඩාම අණුවක් සිට විශාලතම මන්දාකිණිය දක්වා, එහි මැවුම්කරුගේ මහත්වය පෙන්වා දෙයි; මෙම නිසි නීති පද්ධතිය අසංවිධානයෙන් මතු වූවක් බව පැවසීම තර්කානුකූල විය නොහැක, මන්ද මෙම විශ්වය නැති තැනකින් බිහි වූ බව හෝ මෙම අරුම පුදුම සහිත සංකීර්ණ පද්ධතිය අන්ධ අහම්බයක ප්‍රතිඵලයක් බව බුද්ධිය ප්‍රතික්ෂේප කර සිටින බැවිනි.

එමෙන්ම, නිවැරදි බුද්ධිය සහ ආරෝග්‍යමත් සහජ ස්වභාවය, මිනිසාට විශ්වයේ මැවුම්කරුගේ පැවැත්ම පිළිබඳ

විශ්වාසය කරා යොමු කරන අතර, මෙම මැවුම්කරුගේ ගුණාංග සහ ඔහුට අපෙන් හිමිවිය යුතු අයිතිය පිළිබඳව ද සිතන්නට ද ඒ දෙක පාධක වන්නේය.

ඇත්තෙන්ම මෙම මැවුම්කරුගේ ගුණාංග පිළිබඳ සිතා බැලීම, ඔහුගේ පරම පරිපූර්ණත්වය සහ සියලු අඩුපාඩුකම් වලින් පිවිතුරු වීමේ අවශ්‍යතාවය පිළිබඳ ගැඹුරු අවබෝධයක් අපට විවෘත කර දෙයි.

මැවුම්කරු සුවිශුද්ධයාණන් සියලු අලංකාර හා මහාත්ම ගුණාංග වලින් යුක්ත වන බව මෙයින් අදහස් වේ. ඔහු සුවිශුද්ධය, සෑම දෙයක්ම කළ හැකි, සෑම දෙයක්ම දන්නා, සියලු මැවුම් හා නියමයන්හි මහා ප්‍රඥාවන්තය. මෙම පරිපූර්ණත්වය සරලව සිදු විය හැකි දෙයක් නොව, බුද්ධිමය වශයෙන් සිතා බැලිය යුතු අවශ්‍යතාවයකි. ඔහුගේ ගුණාංග වල අඩුපාඩුවක් තිබේ නම්, මැවුම් හා සැලසුම් කිරීමේ දී අඩුපාඩු

තිබිය යුතුය. එවිට එය විශ්වයේ පවතින පරිපූර්ණත්වය හා ගැලපෙන්නේ නැත.

අඩුපාඩුවලින් පිරිසිදු යැයි පැවසීමෙන් මැවුම්කරු තම මැවීම් අතරින් ස්වාධීනයෙකු බව පෙන්වයි. එබැවින් කිසිවෙකුගේ අවශ්‍යතාවක් ඔහුට නැත. නමුත් අනෙකුත් සියලු දෙනා ඔහු වෙත බැගෑපත් වන දිළින්දෝය. ඔහු උත්තරීතරයාණන් සමානකමක් සහ දරුවෙකුගෙන් පිරිසිදුය. මක්නිසාද එය ඍණාත්මක බව හා අසමත් බව පෙන්වයි. අල්ලාහ් උත්තරීතරයාණන් එවැනි සියල්ලෙන් පිරිසිදුය.

එසේ, පරිපූර්ණ හා මහඟු ගුණාංගවලින් යුක්ත සර්වබලධාරී මැවුම්කරු අල්ලාහ් වී නම්, අපව සහ විශ්වය ශුන්‍ය තත්ත්වයේ සිට බිහි කළේ ද ඔහු ය. ඔහු එහි සියල්ලේම හිමිකරුවන අතර, අපට ආහාර සපයා ඔහුගේ කරුණාවෙන් අප ආවරණය කර සිටියි. සියල්ල කළමනාකරණය කරන,

සියල්ලේම පාලක ද ඔහු ය. එසේනම්, අපි ඔහුට ස්තුති කළ යුතු නොවේ ද? ඔහුගේ තෘප්තිය හිමි කර ගැනීමට අපි කටයුතු කළ යුත්තේ කෙසේ ද අපට හිමි වගකීම ඉටු කළ යුත්තේ කෙසේ ද? අප මැවූ අරමුණ සහතික කිරීමට අපි ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි සොයා බැලිය යුතු නොවේ ද?

අල්ලාහ් අපව මවා පසුව අපෙන් ඔහු අපේක්ෂා කරන්නේ කුමක්දැ?යි පැහැදිලි නොකිරීම සාධාරණ ද? ඇයි අපි මෙතන? අපගේ ජීවිතයේ අරමුණ හා ඉලක්කය කුමක්ද? මරණයෙන් පසු අපට කුමක් සිදුවේද?

යමෙක් නවීන තාක්ෂණික උපකරණවලින් යුක්ත සුඛෝපභෝගී මාලිගාවක් ගොඩනගා, අවසන් කළ විට, හදිසියේම කිසිදු හේතුවක් නොමැතිව එය සම්පූර්ණයෙන්ම කඩා දැමුවහොත්, අපි ඔහුට ප්‍රඥාවන්තයෙකු ලෙස විස්තර කළ හැකි ද? බුද්ධිමත් පුද්ගලයෙකුට

නොගැලපෙන, පුහුලෙස සිදුකළ ක්‍රියාවක් ලෙස මෙය සැලකිය නොහැකි ද?

එසේනම්, මෙම ක්‍රියාව මිනිසාට අදාළව පිළිගත නොහැකි නම්, මහා ප්‍රඥාවන්ත, සර්වඥානීය අල්ලාහ් මෙම විශ්වය අතිවිශිෂ්ටත්වයෙන් හා නිරවද්‍යතාවයෙන් නිර්මාණය කර, පසුව එය කිසිදු අරමුණකින් හෝ ප්‍රඥාවකින් තොරව විනාශ කරනු ඇත් ද?

අල්ලාහ් මිනිසුන් මවා ඇත්තේ යම් ශ්‍රේෂ්ඨ ප්‍රඥාවක් සඳහාය. එනම් ඔහුට කිසිවක් ආදේශ නොකර, ඔහුට පමණක් නැමදුම් කිරීම සඳහාය. එමෙන්ම ඔවුන් මෙම ලෝකයේ පරීක්ෂා කිරීම සඳහා මවා ඇත. ඔවුන්ගේ ක්‍රියාවන් පිළිබඳව විනිශ්චය කිරීමට නියමිත දිනයක ඔවුන් නැවත අවදි කරනු ඇත. කවරෙකු අල්ලාහ්ව විශ්වාස කර ඔහුගේ ඇරයුමට පිළිතුරු දුන්නේ ද, ඔහුට සදාකාලිකව ස්වර්ගයේ සතුට හිමි වනු ඇත. කවරෙකු

සත්‍යය පිටුදැක්කේ ද, ඔහු අපාවාසීන් අතරින් කෙනෙකු වනු ඇත.

ඉබාදත් හෙවත් නැමදුම අපට අනිවාර්ය වගකීමකි. මන්ද එය අපගේ පැවැත්මේ අරමුණ වන අතර, එය අල්ලාහ්ගේ පරමාධිපත්‍යය සහ දේවත්වය පිළිබඳව අප පුද කරන ස්තූතිය සහ පිළිගැනීමේ සාක්ෂියකි.

එබැවින් උත්තරීතර සුවිශුද්ධ අල්ලාහ් ඔබව මවා, සවනින් සහ දෘෂ්ටියෙන් ඔබව ගෞරවයෙන් පිදුම් කළ බව මෙනෙහි කරන්න. ගණන් කළ නොහැකි ආශිර්වාදවලින් ඔහු ඔබව ආවරණය කර ඇත. ඔබේ ශිරා තුළ රුධිරය ගමන් කරවන්නේ ඔහුය. ඔබට ජලය සහ වාතය සපයන්නේ ඔහුය. ඔබට ඔහුව සෑම මොහොතකම අවශ්‍යය වනු ඇත. ඔහුගේ කරුණාව සහ සත්කාරය නොමැතිනම්, ඔබ විනාශ වී, ඔබේ ශක්තිය නැති වී යනු ඇත. සැබැවින්ම, ඔබ මවගේ කුසේ කිසිවක් කළ නොහැකි

අසරණව සිටියදී ඔහු ඔබේ පෝෂණය භාරගෙන සිටියේය.

මෙම මහා මැවුම්කරු ඔහුට ගැළපෙන පරිදි නැමදීම් ලබන්නට සුදුසු අයකු නොවේද? එය විය යුත්තේ ඔබට අවශ්‍ය පරිදි නොවේ. ඔබ ඔබේ මවට තෑග්ගක් ලබා දීමට කැමති නම්, ඔබේ කැමැත්තට ගැළපෙන දේ තෝරා ගන්නවාද, නැතහොත් ඇය කැමති දේ හඳුනාගෙන ඇයට ගැළපෙන ආකාරයෙන් සතුටු කිරීමට උත්සාහ කරනවාද? එසේම සර්වබලධාරී අල්ලාහ්ට නැමදීම, අපගේ කැමැත්තට හෝ අපට උරුම වූ චාරිත්‍රයන්ට අනුව හෝ සිදු නොවිය යුතු අතර ඔහුට අවශ්‍ය පරිදි, ඔහු අපට නියම කළ ආකාරයටම විය යුතුය.

නැමදුම, සර්වබලධාරී අල්ලාහ්ට පමණක් විය යුතුය. ඔහු ඒකීයය ඔහුට සමාන කිසිවෙකු නැත. එබැවින් මිනිසාට, තම මැවුම්කරු හැර වෙනත් කිසිවෙකුට නැමදුම පුද කිරීම සුදුසු නැත. අල්ලාහ්ට

ෂිර්ක් කිරීම, එනම් මිනිසා අල්ලාහ් හැර දමා ඔහුගේ නිර්මාණයන්ට නැමදුම් කිරීම, විශාලම පාපය වන අතර, එය නිරයේ සදාකාලික වීමට හේතු වනු ඇත. මෙය, පිළිම, හිරු, සඳු, මිනිසුන්, සත්ත්වයන් හෝ යහපත් පුද්ගලයකු යනාදී දෑට නැමදුම් කිරීම වැන්නක් විය හැක. ඒ සියල්ලම ෂිර්ක් හා කුෆ්ර් වර්ගයන් වන අතර, එම තත්ත්වයේ මිය යන අයගේ දඬුවම, ජහන්නම් හෙවත් අපා ගින්නේ සදාතනික වීම ය.

අල්ලාහ් බොහෝ නබිවරුන් හා දූතවරුන් එවූයේ මෙලොව ජීවිතයේ අපගේ පැවැත්මේ අරමුණ හා ජීවිතයේ අරමුණ පිළිබඳව අපට දැනුම් දීම සඳහා ය. සියලුම දූතවරුන්ගේ පණිවිඩය එකම විය. එනම්, ඉස්ලාම් ආගම හා සර්ව බලධාරී නිර්මාතෘට පමණක් නැමදුම් කිරීම ය. නමුත් පෙර පැවති දූතවරුන් ගෙන ආ පණිවිඩය විකෘති කර වෙනස් කළ අය සිටියහ. එබැවින් අල්ලාහ්,

දූතවරුන්ගේ අවසානයා ලෙස මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව එවීය. එතුමාණන් වෙත මිනිස් වර්ගයාට අවසාන පණිවිඩය වන ශුද්ධ අල් කුර්ආනය පහළ කළේය. අල් කුර්ආනය අල්ලාහ්ගේ වචනය බව සහ එය කිසිදු විකෘතිකරණයකට හෝ වෙනස්කිරීමකට භාජනය නොවූ එකම ග්‍රන්ථය බව තහවුරු කරන බොහෝ බුද්ධිමය හා විද්‍යාත්මක සාධක ඇත. අල් කුර්ආනයේදී අල්ලාහ් අපට දන්වා ඇත්තේ, ඉස්ලාම් ආගම හැර වෙනත් ආගමක් මිනිසාගෙන් පිළිගනු නොලැබෙන බවයි. සියලුම දූතවරුන්ගේ පණිවිඩය එකම වූයේ, නිර්මාතෘගේ ඒකීයත්වය හා ඔහුට පමණක් නැමදුම් කිරීමය. විශ්වාසවන්තයන්ට සදාතනික සුවය සහ සුවිශාල සතුට ඇති ස්වර්ගයක් ඇති බවත්, අල්ලාහ් හැර වෙනත් දෙවියන්ව නමස්කාර කළ හෝ ඉස්ලාම් ආගමට ඇතුළු වීම ප්‍රතික්ෂේප

කළ අයට දැවෙන ගිනි හා දැඩි වේදනාව ඇති බවත් අල් කුර්ආනයේ අල්ලාහ් අපට දන්වා ඇත.

ඉස්ලාමය අනෙකුත් ආගම් වලින් වෙනස් කරන්නේ, මුස්ලිම්වරුන් වනාහී, යථාර්ථවාදී දැනුම් මූලාශ්‍ර මත පදනම්ව, අල්-කුර්ආනය, එය දෙවියන් වහන්සේගේ වචන බවත්, වෙනස්කම් සහ ව්‍යතිරේකයන්ගෙන් ආරක්ෂා කර ඇති බවත්, සාක්ෂි සහ විද්‍යාත්මක සත්‍යයන් ඉදිරිපත් කිරීමට හැකි එකම සමූහයා වීමය.

ශුද්ධ වූ අල් කුර්ආනය යනු, එය අල්ලාහ්ගේ දූත මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පහළ කළ පුස්තකයයි. එය මිනිස් වර්ගයාට සියවස් දහ හතරකට පෙර එවැනි දෙයක් හෝ එවැනි එක් සූරාවක් හෝ ගෙන එන මෙන් අභියෝග කළේය. නමුත් එහි වාග් ශෛලිය, ප්‍රකාශන ශක්තිය, ප්‍රාතිහාර්යය සහ නීතිමය කෙරෙහි

කිසිවෙකුට එවැනි දෙයක් හෝ එයට සමාන දෙයක් ගෙන එන්නට නොහැකි විය. එම අභියෝගය අද දක්වාම පවතී. කාලය පුරා කිසිවෙකුට එවැනි දෙයක් හෝ එයට සමාන දෙයක් ගෙන එන්නට නොහැකි විය. ශුද්ධ වූ අල් කුර්ආනයේ ප්‍රාතිහාර්යය එහි භාෂාවෙහි පමණක් නොව, එය අල්ලාහ්ගේ වදන් බව තහවුරු කරන බුද්ධිමය හා විද්‍යාත්මක සාධකවලට ද විහිදී ඇත. ශුද්ධ වූ අල් කුර්ආනය අල්ලාහ්ගේ වදන් බව තහවුරු කරන පැහැදිලි සාධක අන්තර්ගතව ඇති බැවින්, බුද්ධිමය හා තර්කශීලී ක්‍රියාව නම් මිනිස් අතපෙවීම්වලින් බලපෑම් ලැබූ වෙනත් පොත් මත විශ්වාස කිරීම වෙනුවට එය විශ්වාස කර එහි සඳහන් දේ අනුගමනය කිරීමයි.

නිවැරදි බුද්ධිය අපව මැවුම්කරුවාණන්ගේ වදන්, එනම් විශ්වය නිර්මාණය කර එහි පද්ධතිය පරිපූර්ණ කළ අල්ලාහ්ගේ වදන්, සත්‍යය

දැන ගැනීමට ඇති විශ්වාසනීයම මූලාශ්‍රය බවට පෙන්වයි. අල් කුර්ආනයේ භාෂාමය විශ්මය, විද්‍යාත්මක සත්‍යයන්, සම්පූර්ණ නීති රීති සහ යුගයන් පුරා විකෘතිවීමෙන් ආරක්ෂා වීම දැකීමේදී, එය අල්ලාහ්ගේ වදන් බවට පිළිගැනීමෙන් ඉවත් වන්නට ඉඩ හරින්නේ නැත.

ඒ අනුව, අල් කුර්ආනයේ සඳහන් කර ඇති දේ පිළිබඳ විශ්වාසය යනු විශ්වාසික තේරීමක් පමණක් නොව, සත්‍යය සෙවීමේ තර්කය සමඟ ගැලපෙන බුද්ධිමත් තීරණයකි.

සර්වබලධාරී අල්ලාහ් අල්කුර්ආනයේ පැහැදිලිව දක්වා ඇත්තේ ඔහු අපව නිකරුණේ මවා නැති බවත්, සැබැවින්ම ඔහුට නැමදීම සඳහා අපව මවා ඇති බවත් ය.

සැබැවින්ම අල්ලාහ් අපට අල් කුර්ආනයේ දන්වා ඇත්තේ අප ජීවත් වන මෙලොව ජීවිතය වනාහි ඉක්මනින් අවසන් වන තාවකාලික අවධියක්

පමණක් බවත්, සැබෑ සදාතනික ජීවිතය මතුලොවෙහි විශ්වාසීන් ස්වර්ගයට පිවිසෙන විටත්, ප්‍රතික්ෂේප කරන්නන් අපා ගින්නට පිවිසෙන විටත් පවතින බවයි.

අපව ශූන්‍ය තත්ත්වයෙන් මැවූ මැවුම්කරුට, මියගිය පසු අපව යළි ජීවය දී නැගිටුවීමට නිසැකවම හැකියාව ඇත. විශ්වයේ අල්ලාහ්ගේ සාධක අතර, මියගිය දෑ ජීවමාන කිරීමට අල්ලාහ්ගේ අසීමිත බලය පිළිබඳ ස්පර්ශනීය සාධකයක් අපට දැකිය හැකිය. අල්ලාහ් හරිත ගස්වලින් ගිනි නිපදවන සේම, වියළි පොළොවෙන් පැළෑටි හා පලතුරු නිපදවන සේම, ශුක්‍රාණුවෙන් මවකගේ ගර්භයේ දරු උපත මැවූ සේම, සැබැවින්ම ඔහු මියගියවුන්ට යළි ජීවය දී ඔවුන්ගේ මිණීවලවලින් ඔවුන් අවදි කිරීමට හැකියාව ඇත්තෙකි. විනිශ්චය දිනයේ ප්‍රතිඵල සඳහා ඔවුන් යළි අවදි කිරීමට ඔහුට හැකියාව ඇත. සැබැවින්ම අල්ලාහ්

සියලු දෑ කෙරෙහි සර්ව බලධාරීය. අයුක්තිය හා අසාධාරණය වන්නේ, පීඩකයාගේ සහ පීඩිතයාගේ ජීවිතය වගවීමකින් හෝ දඬුවමකින් තොරව අවසන් වීමය.

යමෙකුට ඇයි ඉස්ලාමය? ඒ හැර වෙනත් ආගම් නොතිබේ ද, යන්න පිළිබඳව ප්‍රශ්න කළ හැකිය!

මිනිසා අනෙකුත් සියලුම මැවීම්වලින් වෙනස් වන විශාලම වෙනස විචක්ෂණ බුද්ධිය තිබීමයි. එහි කාර්යභාරය නම් සිතීම සහ සත්‍යය සෙවීමයි.

ඉස්ලාමය යනු නිවැරදි බුද්ධිය හා සහජ ධර්මතාවට අනුකූල ආගමක් වන අතර, එය ජීවිතයේ විශාල ප්‍රශ්නවලට තර්කශීලී පිළිතුරු ලබා දෙයි. අපි මෙහි සිටින්නේ ඇයි? අපගේ ජීවිතයේ අරමුණ කුමක්ද? මරණයෙන් පසු අපගේ ගමනාන්තය කුමක්ද?

ඉස්ලාම් ආගම මැවුම්කරුට පමණක් නැමදුම් කිරීම සහ "ලා ඉලාහ

ඉල්ලල්ලාහ්" යන පළමු ෂහාදාව පිළිබඳ සාක්ෂි දැරීම මත පදනම්ව ඇත. මෙය ඉස්ලාම් ආගමේ විශ්වාසයේ මූලිකය වන අතර, "නැමදීමට සුදුස්සා අල්ලාහ් පමණක් බව" යන්න අර්ථය වේ.

මෙම සාක්ෂිය අන්තර්ගත කරන්නේ:

තව්හීද්: නැමදීමට සුදුස්සා එකම දෙවිඳාණන් වන අල්ලාහ් බවත් ඔහුට කිසිදු හවුල්කරුවකු නැති බවත් කිසිදු පුත්‍රයෙකු හෝ සමාන අයකු හෝ නැති බවත් විශ්වාස කිරීමයි.

ෂිර්ක් හෙවත් ආදේශ කිරීමෙන් ඉවත් වීම: එනම්; මිනිසුන් විසින් නිර්මාණය කරන ලද සියලුම ප්‍රතිමාවන් හා දේවත්වයන් ප්‍රතික්ෂේප කිරීමය.

ඉස්ලාමය සියලුම දූතවරුන් කෙරෙහි විශ්වාසය අනිවාර්ය කරයි. අල්ලාහ් අල් කුර්ආනයේ දන්වා ඇති පරිදි, මුස්ලිම්වරු ඊසා (ජේසු) තුමා අල්ලාහ්ගේ ගැත්තකු බවත්, ඔහුගේ දූතයකු බවත් විශ්වාස කරති. එතුමා අල්ලාහ්ගේ පුත්‍රයා

නොවන බවත්, අල්ලාහ් සර්වබලධාරී වන බැවින් ඔහුට සහකාරියක හෝ දරුවකුගේ අවශ්‍යතාව නොමැති බවත්, ඔහුට කිසිවක් අවශ්‍ය නොවන බවත් විශ්වාස කරති. අල්ලාහ් අල් කුර්ආනයේ දන්වා ඇති පරිදි, ඊසා වක්තෘවරයකු බවත්, අල්ලාහ් එතුමාට බොහෝ ප්‍රාතිහාර්යයන් පිරිනමා ඇති බවත්, අල්ලාහ්ට පමණක් නැමදුම් කළ යුතුය, ඔහුට කිසිවකු ආදේශ නොකළ යුතුය යැයි එතුමා තම ජනයාට ඇරයුම් කිරීම උදෙසා අල්ලාහ් එතුමාව එවූ බවත් දන්වා ඇත. එමෙන්ම ඊසා (ජේසු) තුමා තමන්ට නැමදුම් කරන මෙන් මිනිසුන්ගෙන් ඉල්ලීම් නොකළ අතර, එතුමා පවා නැමදුම් ඉටු කළේ එතුමාගේ මැවුම්කරු වෙත පමණය. එබැවින්, ඔබට අල්ලාහ් ප්‍රිය කරන සත්‍යය මත ඊසා කෙරෙහි විශ්වාසයක් ඇති කිරීමට අවශ්‍ය නම්, ඉස්ලාමය වෙත පිවිසිය යුතුය.

අල් කුර්ආනයේ අල්ලාහ් අපට දන්වා ඇත්තේ ඊසා (ජේසු) තුමා තම සමූහයාට අල්ලාහ්ට පමණක් නැමදුම් කරන ලෙස නියෝග කළ බවත්, ඔහුට යමක් ආදේශ කිරීමෙන් වළකින්නැයි ඔවුන්ට අවවාද කළ බවත් ය.

බුද්ධිමත් අයකු තමන් මෙන් මැවීමකට, ආහාර සහ ජලය අවශ්‍ය වන, මරණය හෝ හානිය වළක්වා ගැනීමට නොහැකි මැවීමකට නැමදීම සාධාරණ ද? අහෝ මිනිස, ඔබ ජේසු මරියාගේ පුත්‍රයාණන්ට නැමදුම් කළ හැක්කේ කෙසේ ද? එතුමා ආහාර සහ ජලය අවශ්‍ය වූ මිනිසෙකු වූ අතර, තම මැවුම්කරුට නැමදුම් කර ඔහු වෙත යොමු වූ අයෙකි. දෙවියන් තමන්ටම පූජා කරන බව බුද්ධියට හැඟෙන්නේ කෙසේ ද? අල්ලාහ් විශිෂ්ටත්වය හෙබි, පරිපූර්ණත්වයෙන් පිරිපුන්, සමානත්වය සහ ආදේශය නොමැති අය නොවේද? විශ්වයේ පවතින සියලුම දේවල් ඇත්තේ සර්ව බලධාරී අල්ලාහ්ගේ යටතේය.

අහස සහ පොළොව නිර්මාණය කළ නිර්මාතෘ, ළදරුවෙකු ලෙස උපත ලබා, තම මැවීමකට යටත් වී ඔවුන් විසින් කුරිසියේ ඇණ ගසන්නට ඉඩ දෙන බව බුද්ධියට හැඟෙන්නේ කෙසේ ද? කුරිසියේ ඇණ ගසනු ලැබ මිය ගිය ඇත්තන් විනාශවී යන මිනිසුන් වෙති. නමුත් මැවුම්කරු, මිය නොයන, මද නින්දයක් හෝ සාමාන්‍ය නින්දක් හෝ ඇති නොවන, සර්ව බලධාරී ජීවමාන අයෙකි. ඔහුගේ විශිෂ්ටත්වයේ සහ සර්බලධාරීත්වයේ පරිපූර්ණත්වය ඔහු මෙන් කෙනෙකු නැති බව පෙන්වා නොදෙන්නේ ද?

අල්ලාහ් අපට අල්-කුර්ආනයේ දන්වා ඇත්තේ සියලුම දූතවරුන් එකම පණිවිඩයක් සමග පැමිණි බවයි. එනම් ඔවුන්ගේ ජනතාව අල්ලාහ්ට පමණක් නැමදුම් කිරීමට ඇරයුම් කිරීමය. නමුත් කාලයත් සමග කිහිප දෙනෙකු මෙම සදාතනික පණිවිඩය විකෘති කළහ. එවිට

නබිවරුන් ගෙන ආ ඒක දේවත්වයේ ආලෝකය ඔවුන් මකා දැමූහ. එබැවින් අල්ලාහ් අවසන් නබි වූ මුහම්මද් ﷺ තුමාණන් එවා කුර්ආනය ඔහු වෙත පහළ කළේ, පෙර දූතවරුන් ගෙන ආ ඒක දේවත්වයේ පණිවිඩය නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහාය.

## අවසාන වශයෙන් මෙසේ පවසමි, අහෝ මිනිස!

ඉස්ලාමය බුද්ධිමය හා සහජතාවේ දහම වන අතර, එය මහා මැවුම්කරු මිනිස් වර්ගයාට නියම කළ එකම දහම වේ. එබැවින් සෑම බුද්ධිමත් මිනිසෙකුම ඉස්ලාමය තුළට පිවිසීමට යුහුසුළු විය යුතුය. එනම් අල්ලාහ් පරමාධිපති ලෙසත්, ඉස්ලාමය දහම ලෙසත්, මුහම්මද් තුමාණෝ දේව දූතයාණන් ලෙසත් විශ්වාස කිරීමය. මෙම විෂයයෙහි මිනිසාට තේරීමේ අයිතියක් නැත. හේතුව සැබැවින්ම දූතවරුන්ට කවර පිළිතුරක් පිරිනැමුවේ ද ඒ ගැන මළවුන්

කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් විමසා සිටින බැවිනි. ඔහු දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයකු නම් ඔහුට අති මහත් ජයග්‍රහණය හා සාර්තකත්වය ඇත. නමුත් ඔහු දේවත්වය ප්‍රතික්ෂේප කරන්නෙකු නම් ඔහුට පැහැදිලි පරාජය ඇත.

ඔබ මෙලොව සැබෑ සතුට සහ මතුලොව ජයග්‍රහණය සොයන්නේ නම්, ඔබේ ජීවිතයේ ගත හැකි විශාලතම තීරණය ඉස්ලාමය තුළට පිවිසීම බව වටහා ගන්න. ඔබ කළ යුත්තේ අවංක විශ්වාසයෙන් මෙම වචන ප්‍රකාශ කිරීම පමණි: "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු, වඅෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්" (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැති බව මම සාක්ෂි දරමි. සැබැවින්ම මුහම්මද් තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් බවත් මම සාක්ෂි දරමි) ඉන්පසුව ඔබේ දහම හැදෑරීම ආරම්භ කර, මෙම සාක්ෂියේ

ප්‍රකාශය පවරන අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් පිළිබඳ විශ්වාසය සහ ඉස්ලාමයේ මූලික කටයුතු පිළිපැදීම සඳහා ක්‍රියාත්මක වන්න.

දැන්ම එය කියන්න, සැක ඇති කර නොගන්න; මරණය හදිසියේම පැමිණිය හැක, එවැනි වැදගත් තීරණයක් ප්‍රමාද නොකරන්න, ෂෙයිතාන්ට ඔබව යහපත් කටයුතුවලින් වළක්වන්න ඉඩ නොදෙන්න, ධෛර්යවන්ත වන්න. ඔබේ මාර්ගය ආලෝකය සහ ඍජු මාර්ගය වෙත ආරම්භ කරන්න.

ඔබේ තීරණය දැන් ගන්න, සහ තෘප්තියෙන් සහ සතුටින් පිරුණු නව ජීවිතයක් ආරම්භ කරන්න.

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බව මම සාක්ෂි දරමි. එමෙන්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයෙකු බවද මම සාක්ෂි දරමි.

# පටුන


ඔබ ඔබේම හදවතින් විමසා බැලුවෙහි ද? ඔබව මැව්වේ කවු ද? ඒ ඇයි? මරණයෙන් පසු කුමක් වේවි ද? ...................... 2

ඔබ ඔබෙන් විමසා බැලුවෙහි ද? ඔබව මැව්වේ කවු ද? ඒ ඇයි? මරණයෙන් පසු කුමක් පවතින්නේ ද?............................ 2

අවසාන වශයෙන් මෙසේ පවසමි, අහෝ මිනිස! ................ 22



si459v2.0 - 06/09/2026